# සමූපකාර සේවක කොමිෂන් සභාව (දකුණු පළාත)
# கூட்டுறவு ஊழியர் ஆணைக்குழு (தென் மாகாணம்)
# Co-operative Employees Commission (Southern Province)

සැලසුම් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ල (1 වන මහල), එස්. එච්. දහනායක මාවත, ගාල්ල.
திட்டமிடல் செயலாளர் அலுவலக் கட்டிடம் (1ம் மாடி), எஸ்.எச், தஹநாயக மாவத்தை, காலி.
**Planning Secretariat Building (1 st Floor), S. H. Dahanayaka Mawatha, Galle.**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. — SP/CEC/1/O/5 | ඔබේ අංකය / உனது இல / Your No. — | දිනය / திகதி / Date — 2024.01. 30 |

චක්‍ර ලේඛ අංක 4/2024

දකුණු පළාතේ සියලුම සමූපකාර සමිති සභාපතිවරුන් වෙත,

<u>දකුණු පළාත් සමූපකාර සේවකයින් බඳවා ගැනීමේ පොදු උපදෙස්</u>

දකුණු පළාත් කොමිෂන් සභාව වෙත පත්වීම් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ගොනු පරීක්ෂා කිරීමේ දී සමූපකාර සේවකයින් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේ දී විවිධ ක්‍රමවේද අනුගමනය කරන බව නිරීක්ෂණය වන බැවින් ඒ සඳහා පොදු උපදෙස් ලබා දීම සඳහා මෙම චක්‍රලේඛ නිකුත් කරන ලදී.

01. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත්කිරීමේ සංයුතිය පහත පරිදි විය යුතුය.

01.1 මෙහෙයුම් හා සහාය සේවා මට්ටම් සඳහා සේවකයින් බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පහත පරිදි විය යුතුය.

I. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අවමය 03 ක් සහ උපරිමය 05 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.
II. සමිතියේ සභාපති හෝ උපසභාපති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කළ යුතුය.
III. සමූපකාර සමිතිය භාර සමූපකාර සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අනිවාර්ය සමාජිකයෙකු විය යුතුය.
IV. සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ/කාරක සභාවේ සමාජිකයෙකු හෝ සමානාධිකාරී/ගණකාධිකාරී/සමූපකාර ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රාමාණික දැනුම ඇති භාහිර නිලධාරියෙකු යන අයවලුන් අතරින් අවම වශයෙන් එක් අයෙකු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සමාජිකයෙකු විය යුතුය. (උපරිම සමාජික සංඛ්‍යාව 03 කි).

01.2 විධායක හා අධීක්ෂණ මට්ටම් සඳහා සේවකයින් බඳවා ගැනීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පහත පරිදි විය යුතුය.

I. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සමාජිකයින් 05 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.
II. සමිතියේ සභාපති හෝ උපසභාපති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කළ යුතුය.
III. සමූපකාර සමිතිය භාර සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධාරියෙකු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අනිවාර්ය සමාජිකයෙකු විය යුතුය.
IV. සමූපකාර ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රාමාණික දැනුම ඇති භාහිර නිලධාරියෙකු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අනිවාර්ය සමාජිකයෙකු විය යුතුය.
V. ප්‍රධාන විධායක මට්ටමේ තනතුරක් සඳහා බඳවා ගැනීමේ දී සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයින් 02 නෙකු සහභාගී විය යුතුය.
VI. මධ්‍ය විධායක මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීමේ දී සමිතියේ ප්‍රධාන විධායක මට්ටමේ නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයෙකු සහභාගී විය යුතුය.


ලේකම් / செயலாளர் / Secretary — 091-2232794
පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer — 091-2234279
කාර්යාලය/ෆැක්ස් / அலுவலகம்/பெக்ஸ் / Office/ Fax — 091-2234383
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site — www.cec.sp.gov.lk
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail — empcommicoopsp@sltnet.lk

01. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ පටිපාටිය පහත පරිදි විය යුතුය.

| නිර්ණායකය | ලකුණු ලබා දීමේ පටිපාටිය | ලකුණු |
|---|---|---|
| තනතුරට අදාළ මූලික අධ්‍යාපන සුදුසුකම් | පරීක්ෂා කිරීම සිදු කළ යුතුය (මූලික අධ්‍යාපන සුදුසුකම් නොමැති නම් බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි.) | - |
| තනතුරට අදාලව ඉල්ලා ඇති වෘත්තිය සුදුසුකම් හා සේවා පළපුරුද්ද | පරීක්ෂා කිරීම සිදු කළ යුතුය (මූලික සුදුසුකම් නොමැති නම් බඳවා ගැනීමට සුදුසුකම් නොලබයි.) | - |
| මූලික අධ්‍යාපන සුදුසුකමට වඩා අයදුම්කර අත්පත් කර ගත් ඉහල අධ්‍යාපන සුදුසුකම් | සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර ලකුණු ලබා දීමේ නිර්නායක සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධාරියෙකුගේ නිර්දේශ ලබා ගත යුතුය. | 30 |
| බඳවා ගැනීම සඳහා ඉල්ලා ඇති වෘත්තිය සුදුසුකම් හා සේවා පළපුරුද්දට වඩා අයදුම්කරු අත්පත් කර ගත් ඉහල සුදුසුකම් | සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර ලකුණු ලබා දීමේ නිර්නායක සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධාරියෙකුගේ නිර්දේශ ලබා ගත යුතුය. | 30 |
| මූලික සුදුසුකමට අමතරව සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් | සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට පෙර ලකුණු ලබා දීමේ නිර්නායක සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධාරියෙකුගේ නිර්දේශ ලබා ගත යුතුය. | 20 |
| නිර්මාණශීලිත්වය, සන්නිවේදනය හා නායකත්ව කුසලතා (ලිඛිත සාක්ෂි) | ලිඛිත සාක්ෂි පරීක්ෂා කළ යුතුය. | 10 |
| පෞර්ශත්වය හා ඉදිරිපත් කිරීම | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් | 10 |

ජයන්ත ජී.ලියනගේ
ලේකම් (වැ.බ.),
සමුපකාර සේවක කොමිෂන් සභාව,
දකුණු පළාත.

පිටපත - -1. ලේකම්, කෘෂිකර්ම,ගොවිජන සංවර්ධන ........ සමුපකාර අමාත්‍යාංශය - දැ.ගැ.ස.

2. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්, දකුණු පළාත - කරු.සමු.සං.ප්‍රා.නි. හරහා අදාල සමිති දැනුවත් කිරීම සඳහා

3. දකුණු පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ ගොනුවට